**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 394**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අටවැනි වාර්තාව

(2025.08.20 වැනි දින ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2025 දෙසැම්බර් මස 18 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය
කළ යුතු යැයි නියෝග කරන ලදී*

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>**

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., (2025.03.21 දින සිට.)
4. ගරු(නීතිඥ) දයාසිරි ජයසේකර මහතා,පා.ම., (2025.05.20 දින සිට)
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., (2025.03.21 දින සිට)
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., (2025.03.21 දින සිට)
8. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., (2025.05.20 දින සිට)
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., (2025.03.21 දින සිට)
12. ගරු අබුබකර් අතම්බාවා මහතා, පා.ම., ( 2025.05.08 දින සිට)
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., (2025.03.21 දින සිට)
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., (2025.03.21 දින සිට)
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., (2025.05.08 දින සිට)
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., (2025.03.21 දින සිට)
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,

24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)

<u>**කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය**</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - හිමාලි සමරදිවාකර මෙය
- ❖ ප්‍රධාන නිලධාරී - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. ලක්ෂාන් වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

**කාරක සභා වාර්තා**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

**පටුන**


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | V |
| 2. | විධායක සාරාංශය | VII |
| 3. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 01 |
| 4. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද ආයතනය<br>- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | 02-15 |

## සභාපතිතුමාගේ සටහන

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025.08.20 වැනි දින පරීක්ෂාවට ලක් කළ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳව සවිස්තරාත්මකව සිදුකළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

සැමට සුරක්ෂිත අහසක් සහතික කරමින් දක්ෂ හා විශ්වාසදායක ගුවන් සේවා ආරක්ෂක නියාමකයෙකු වීමේ දැක්මක් සහ උපායමාර්ගික සැලසුම්කරණය සහ ඵලදායී නියාමනයකට පහසුකම් සැලසීම සඳහා, ජාත්‍යන්තර ප්‍රමිති, නිර්දේශිත පිළිවෙත් හා ජාතික ව්‍යවස්ථාදායක අවශ්‍යතාවන්ට අනුකූල වන ආරක්ෂිත, කාර්යක්ෂම, නිත්‍ය සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම යන මෙහෙවරක්ද සහිත සිවිල් ගුවන් සේවා අධිකාරිය සිය නියාමන කාර්යය කොපමණ ඵලදායි ලෙස සිදුකරනවාද යන්න අපගේ විමර්ශනයට පාදක විය.

ජ්‍යෙෂ්ඨ හා තෘතීය මට්ටමේ පුරප්පාඩු 30ක් පමණ පැවතීම, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට අවශ්‍ය සංශෝධන නියාමන කාර්යයට ගැලපෙන පරිදි සිදු කිරීම ප්‍රමාද වීම, රු. මිලියන 20,630 ක විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම් ලෙස පවත්වාගෙන යාම, අධිකාරිය සතු වත්කම් හා ඉඩම් සම්බන්ධයෙන් නිසි තක්සේරුවක් නොතිබීම ආදි කරුණු සම්බන්ධයෙන් කාරක සභාව අවධානය යොමු කරන ලදී. 2026 වසරේදී අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ විගණනයට මුහුණ දීමට බලාපොරොත්තු වන බැවින් ආයතනයේ නියාමන කාර්යයන්හි ඵලදායිතාවයට උක්ත සාධක අහිතකර ලෙස බලපෑ හැකි බැවින් එකී අඩුපාඩු හැකි ඉක්මණින් සපුරා ගැනීම වැදගත් බව අපගේ විමර්ෂණයේදී නිරීක්ෂණය විය.

මෙම විමර්ශන ක්‍රියාවලියේදී සමස්ථ සභික මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාශීලී සහභාගීත්වය හා සවිස්තරාත්මක විචාරනය ඉතා අගය කොට සලකමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශකවරයන් දෙදෙනාගේ සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගේ සහ වැඩබලන විගණකාධිපතිතුමා ප්‍රධාන

ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

## විධායක සාරාංශය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) විසින් 2022 හා 2023 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ විභාග කරන ලදී. විගණකාධිපතිවරයාගේ මතය අනුව සිවිල් ගුවන් සේවා අධිකාරියට 2022 හා 2023 යන වර්ෂ ඇතුළත තත්ත්වාගණනය කළ මතයක් ලැබී තිබුණි.

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට අවශ්‍ය සංශෝධන හඳුනාගෙන, කැබිනට් අනුමැතිය ලබාගෙන, එම කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත

අධ්‍යක්ෂ මණ්ඩලයට සිවිල් ගුවන් සේවා අත්දැකීම් සහිත සාමාජිකයන් දෙදෙනෙකු පත් කර නොතිබුණු අතර, ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර වැඩබලන තනතුරක් ලෙස පැවතුණි.

ජාතික ප්‍රතිපත්ති අනුව වසර 5ක උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු වුවද, අධිකාරිය විසින් 2025 සිට 2027 දක්වා වසර 3ක කාලයක් සඳහා පමණක් 'rolling over' ආකාරයට සැලැස්මක් සකස් කර තිබීම අවධානයට ලක් විය .

2025 ජූලි 30 දිනට අනුමත තනතුරු 208න් පුරප්පාඩු 43ක් නිරීක්ෂණය විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතීය මට්ටමේ තනතුරුවල පුරප්පාඩු වැඩි වශයෙන් පැවතුණි. ICAO නිර්ණායකයන්ට අනුකූල වන පරිදි බඳවා ගැනීමේ පටිපාටීන් (SOR) සංශෝධනය කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ඇත.

2008 වර්ෂයේ සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ එකතු කරන ලද රු. මිලියන 20,630 ක විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම් ලෙස පවත්වාගෙන ගොස් ඇත. 2025 ජූනි 30 වන විට ගුවන් සමාගම්වලින් අපගමන බද්දු මුදල් වශයෙන් රු.මිලියන 30,844.4 ක් සහ ඇ.ඩො. 1,541,962 අධිකාරියට අයවිය යුතුව තිබුණි.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව සතු තලංගම ඉඩම (අක්කර 52) හමුදා මූලස්ථානය සඳහා පවරා ගැනීමෙන් පසු, එයට හිලව් වශයෙන් ලැබුණු සීතාඑළිය කඳපොළ වනාන්තරයේ හෙක්ටයාර 0.9431 ක භූමි ප්‍රමාණය 2025 පෙබරවාරි 28 දින වන විටත් අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි

ගින්නකින් හානි වූ වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තුගත රු. මිලියන 16 ඉක්මවා මුළු වියදම රු. මිලියන 24ක් ඒ සඳහා වැය කොට ඇත. බංගලාවේ පරිපාලනය සිදු කළ සේවා සපයන සමාගමට මාසිකව රු. 210,000/- ක් ගෙවුවද, බංගලාවෙන් ලද වාර්ෂික ආදායම රු. 200,000/-ත් 400,000/-ත් අතර විය.2021 දී අංක 09 දරන නිල නිවාසය ප්‍රතිසංස්කරණය සඳහා රු. මිලියන 10.67 ක් වැය කර තිබුණද, ප්‍රතිසංස්කරණයට පෙර තිබූ ප්‍රධාන ව්‍යුහාත්මක අඩුපාඩු ඉන් පසුවත් එසේම පැවතුණි .

ගුවන් යානා පහසුකම් සහ ඉඩම්, විධිමත් බදු ගිවිසුමකින් තොරව සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (AASL) සමාගමට ලබා දී තිබුණි. මෙම පහසුකම් සඳහා AASL සමාගමෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර, ගාස්තු පැණවීමේ යෝජනා ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

2019 දී ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස මෙහෙයුම් ආරම්භ කළ යාපනය ගුවන් තොටුපළේ අක්කර 349ක ඉඩම්වල මායිම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය අධිකාරිය විසින් අවසන් කර තිබුණු අතර අදාළ ඉඩම්වල මායිම් ගැසට් කිරීම සඳහා අවශ්‍ය නියෝග මේ වන නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

කේප්ටවුන් සම්මුතිය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්මුති පනත් කෙටුම්පත භාෂා තුනෙන්ම සම්පාදනය කර අවසන් කොට නීතිපතිවරයාගේ නිෂ්කාශනය ලැබීමට නියමිතව පවතී.

| අනු අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| **01** | 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනතට සිදු කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් සලකා බැලීම | 2 |
| **02** | අධ්‍යක්‍ෂ මණ්ඩල සංයුතිය | 3 |
| **03** | සංයුක්ත සැලැස්ම | 4 |
| **04** | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු | 5 |
| **05** | අධිකාරිය එකතු කරන ලබන විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම | 6 |
| **06** | අධිකාරිය වෙත ගුවන් සමාගම් වෙතින් අය විය යුතු අපගමන බදු මුදල්වල හිඟ පැවතීම | 8 |
| **07** | අධිකාරිය සතුව තිබූ තලංගම, අකුරේගොඩ ඉඩම වෙනුවට සීතාඑළිය කඳපොළ වනාන්තරයෙන් ලබා දුන් ඉඩමේ අයිතිය පවරා ගැනීමට අධිකාරිය අපොහොසත් වීම. | 10 |
| **08** | වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය. | 11 |
| **09** | අධිකාරිය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල නිවාසය අලුත්වැඩියා කිරීම. | 13 |
| **10** | විධිමත් බදු ගිවිසුමකින් තොරව සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්) සමාගමට ඉඩම් ලබාදීම. | 14 |
| **11** | යාපනය ගුවන් තොටුපලේ ඉඩම් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම. | 14 |
| **12** | කේප්ටවුන් සම්මුතිය බලාත්මක කිරීම. | 15 |

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අටවැනි වාර්තාව**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ අටවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව- 2025.09.04 දිනට )
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දී සිය පරීක්ෂණ කටයුතු ආරම්භ කළ 2025.02.18 දින සිට 2025.11.26 දක්වා කාල සීමාව තුළදී පහත සඳහන් ආයතන කැඳවා පරීක්ෂා කරන ලදී.

| අනු අංකය | ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 18.02.2025 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 20.02.2025 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 27.02.2025 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 05.03.2025 |

| | | |
|---|---|---|
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 12.03.2025 |
| 6. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 26.03.2025 |
| 7. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 27.03.2025 |
| 8. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 02.04.2025 |
| 9. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 08.05.2025 |
| 10. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 09.05.2025 |
| 11. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 15.05.2025 |
| 12. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 23.05.2025 |
| 13. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 04.06.2025 |
| 14. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 20.06.2025 |
| 15. | මහපොළ භාරකාර අරමුදල | 09.07.2025 |
| 16. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 17.07.2025 |
| 17. | රාජ්‍ය දැව සංස්ථාව | 23.07.2025 |
| 18. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 20.08.2025 |
| 19. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 10.09.2025 |
| 20. | භූවිද්‍යා හා පතල් කාර්යාංශය | 12.09.2025 |
| 21. | ලංකා විදුලිබල මණ්ඩලය | 24.09.2025 |
| 22. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 08.10.2025 |
| 23. | ලංකා සතොස | 10.10.2025 |
| 24. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්.හෝල්ඩින්ස් සමාගම | 24.10.2025 |
| 25. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 13.11.2025 |
| 26. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 19.11.2025 |
| 27. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 26.11.2025 |

ඒ අතරින්, 2025.08.20 දින පරීක්ෂාවට ලක් කළ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2022 සහ 2023 වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තා සහ එම අධිකාරියේ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට නිකුත් කළ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| <u>ආයතනය</u> | <u>විගණන මතය</u> | |
|---|---|---|
| | <u>2022</u> | <u>2023</u> |
| ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

<u>විගණන මත වර්ග</u>

01 <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

02 <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

03 <u>මතය ව්‍යාවනය කිරීම</u> **(Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

04 <u>අහිතකර මතය</u> **(Adverse Opinion)**
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

**<u>ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය</u>**
***(වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය)***

**විමර්ශනය කරන ලද දිනය** - 2025.08.20

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

**01. <u>2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ සිදු විය යුතු සංශෝධන සම්බන්ධයෙන් සලකා බැලීම</u>**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) මුහුණ දී ඇති අවස්ථා සහ අපේක්ෂිත වර්ධනයන්ට අනුරූප වන පරිදි, 2002 අංක 34 දරණ සිවිල් ගුවන් සේවා අධිකාරී පනත සහ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත වත්මන් තත්ත්වයට ගැලපෙන ලෙස සංශෝධන කළ යුතුව පැවතිනි.

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් ඇමුණුම් 19ක් සහිතව ගුවන් ගමන් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, නියාමනය සහ නව ගගන වෘත්තීයවේදීන් නිර්මාණය කිරීම පිළිබඳව නිර්දේශ නිකුත් කර ඇති අතර CAASL විසින් ඒවා ක්‍රියාවට නැංවීම සිදු කරයි. ICAO නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා CAASL හා පෞද්ගලික අංශය අතර හවුල්කාරිත්වයක් අනිවාර්ය වන අතර, මේ අනුව පුහුණු පාසල්, දේශීය ගුවන් සේවා සමාගම් සහ නඩත්තු සමාගම් සමඟ CAASL සම්බන්ධතා පවත්වාගෙන යයි.

නව අභ්‍යන්තර ගුවන් තොටුපළවල් සහ නව දේශීය ගුවන් සේවා සමාගම් පිහිටුවීමට පහසුකම් සැලසීම සිදු කෙරේ. පාර්ශ්වකරුවන්ගේ ගැටලු විසඳීමට හා පහසුකම් සැපයීමට ICAO හි 9 වැනි ඇමුණුම ප්‍රකාරව උපදේශන කමිටුවක් පිහිටුවීමට හා මෙම කරුණු සලකා බලා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පැවතිනි. ඒ අනුව, පනතේ

විධිවිධානවලට සිදු කළ යුතු සංශෝධන හඳුනාගෙන, ඒවා සංශෝධිත පනත් කෙටුම්පතට ඇතුළත් කර ඇත.

සිවිල් ගුවන් සේවා අධිකාරිය 2026 වර්ෂයේදී අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) විගණනයකට මුහුණ දිය යුතු බැවින්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට සිදු කළ යුතු සංශෝධන හඳුනාගෙන, කැබිනට් අනුමැතිය ලබාගෙන, එම සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන කටයුතු ක්‍රියාවලියේ පවතී.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**සිවිල් ගුවන් සේවා අධිකාරියේ කටයුතු අපේක්ෂිත වර්ධනයකින් සිදු කිරීම සඳහා 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතෙහි සිදු කළ යුතු සංශෝධන හඳුනා ගැනීමත් ඒ සඳහා ගෙන ඇති පියවරයන්හි ප්‍රගතිය විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව කාරක සභාවට යොමු කිරීම.**

## 02. <u>අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය</u>

- **අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පනතේ විධිවිධානවලට අනුකූල නොවීය: 2002 අංක 34 දරණ** සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ 3(1) වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් **පස් දෙනෙකු** ඇතුළුව **සාමාජිකයන් අට දෙනෙකුගෙන්** යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පිහිටුවිය යුතු වුවද, පත් කළ යුතු සාමාජිකයන් **පස් දෙනා** තුළ ඇතුළත් විය යුතු **සිවිල් ගුවන් සේවා අත්දැකීම් සහිත සාමාජිකයන් දෙදෙනෙකු** පත් කර නොමැති බව සහ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල් තනතුර වැඩබලන තනතුරක් ලෙස පවතින බව.
- **ආයතනික පාලන මාර්ගෝපදේශ උල්ලංඝනය:** රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.4 ඡේදය ප්‍රකාරව, අධ්‍යක්ෂවරුන් වාර්ෂිකව ඔවුන්ගේ රාජකාරිවලට බලපාන මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා නොමැති බවට ප්‍රකාශ කළ යුතු වුවද, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගෙන් එම ප්‍රකාශ ලබාගෙන නොතිබුණි.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.4 ඡේදය ප්‍රකාරව අධිකාරියේ අධ්‍යක්ෂවරුන් හට ඔවුන්ගේ රාජකාරිවලට බලපාන මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා නොමැති බවට ප්‍රකාශ වාර්ෂිකව ලබා ගැනීමට කටයුතු කිරීම.**

## 03. <u>සංයුක්ත සැලැස්ම</u>

2025.03.24 දිනැති ජනාධිපති ලේකම්ගේ PS/SB/ Circular/ 03/25 චක්‍රලේඛය ප්‍රකාරව, රටේ ජාතික ප්‍රතිපත්ති අනුව **වර්ෂ 05ක්** සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු වුවද, අධිකාරිය විසින් **2025 සිට 2027 දක්වා වර්ෂ 3ක** කාලයක් සඳහා පමණක් උපායමාර්ගික සැලැස්මක් සකස් කර තිබුණි. තවද,එම ජනාධිපති චක්‍රලේඛය ප්‍රකාරව **2025 වර්ෂය** සඳහා ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ලේඛනය සහ ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන වී නොතිබුණි.

2025 වර්ෂය අවසානය වන විට, 2026 වර්ෂයේ සිට 2030 **දක්වා වර්ෂ 5ක්** සඳහා rolling over ආකාරයට සංයුක්ත සැලැස්ම සකස් කිරීමට අධිකාරියේ අපේක්ෂාව බව අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**අධිකාරියේ 2026 -2030 උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී අංක PS/SB/Circular/03/2025 සහ 2025 මාර්තු 24 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම rolling over ක්‍රමයට වර්ෂ 5කට සකස් කිරීම. ඊට අනුකූලව අයවැය ලේඛනය සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කිරීම.**

## 04. <u>කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු</u>

2025 ජූනි 30 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි විය. සමස්ථ අනුමත තනතුරු සංඛ්‍යාව **208ක්** වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව **43ක්** ක්ව පැවතිණි.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු :පුරප්පාඩු **14ක්** (අනුමත **52**, තත්‍ය **38**).

තෘතීය මට්ටමේ තනතුරු: පුරප්පාඩු **16ක්** (අනුමත 57, තත්‍ය 41).

ද්විතීය මට්ටමේ තනතුරු: පුරප්පාඩු **12ක්** (අනුමත 60, තත්‍ය 48).

ප්‍රාථමික මට්ටමේ තනතුරු: පුරප්පාඩු **01ක්** (අනුමත 39, තත්‍ය 38).

ජ්‍යෙෂ්ඨ හා තෘතීය තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සකසා ඇත්තේ **අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිතීන්ට** අනුකූලව වන අතර, ඒ අනුව එම තනතුරුවලට අදාළව ඉහළ මට්ටමේ වෘත්තීය හා අධ්‍යාපනික සුදුසුකම් අපේක්ෂා කෙරේ. එම තනතුරු පුරප්පාඩු ගැසට් කර, පුවත්පත් දැන්වීම් පළ කළද, සුදුසු අයදුම්කරුවන් නොමැති තත්ත්වයක් උද්ගතවී ඇත.

ප්‍රමාණවත් සුදුසුකම් සහිත වෘත්තිකයන් නොමැති වීම හේතුවෙන් **2026 වර්ෂයේදී** අධිකාරිය මුහුණ දීමට නියමිත **ICAO විගණනයේදී** අධිකාරියට ලබා දෙන ලකුණු මට්ටම් පහළ යාමට හැකි බවත්, එයන් රටට විශාල හානියක් විය හැකි බවත් නිරීක්ෂණය විය.

බඳවා ගැනීමේ පටිපාටිය (SOR) සකස් කළ යුත්තේ **ICAO නිර්ණායකයන්ට** අනුකූලව බවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්ණායකයන්ට අනුව සකස් කරනු ලබන SOR මගින් අධිකාරියේ අවශ්‍යතාය ඉටු නොවන බවත්, ඒ අනුව, අධිකාරිය විසින් **ICAO ප්‍රමිතීන්ට** අනුකූලව සංශෝධනය කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් අනාවරණය විය.

අන්තර්ජාතික සිවිල් ගුවන් සංවිධානයේ (ICAO) නිර්ණායකයන්ට අනුකූල වන පරිදි සිවිල් ගුවන් සේවා අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටීන් (SOR)

සකස් කිරීම පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට අදාළ බඳවා ගැනීමේ පටිපාටීන්(SOR) සකස් කොට ඒවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට කටයුතු කිරීම හා අදාළ ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ලබා දෙන ලෙසට කරන ලද නිර්දේශයට අනුව ඒ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා තිබිණි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. 2026 වසරේ සිදුකිරීමට නියමිත අන්තර්ජාතික සිවිල් ගුවන් සංවිධානයේ (ICAO) විගණනය සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ තනතුරුවල පුරප්පාඩු වහාම පිරවීමට අවශ්‍ය පියවර ගැනීම.**

**II. දිගු කාලීනව අධිකාරියේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා දැනට විදේශගතව සිටින එහෙත් ලංකාවට ආපසු පැමිණ සේවය කිරීමට කැමැත්තෙන් පසුවන පුද්ගලයන් ඇතුළු පුද්ගලික අංශයේ හා ගුවන් හමුදාවේ සේවය කරන සිවිල් ගුවන් ක්ෂේත්‍රයේ වෘත්තීයවේදීන් ආකර්ෂණය කර ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කිරීම.**

**05.** <u>අධිකාරිය එකතු කරනු ලබන විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම</u>

**2008** මැයි **22** දිනැති අංක **1550/7** දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ 7 සහ 8 වගන්තීන් ප්‍රකාරව, අධිකාරිය විසින් එකතු කරනු ලබන විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් 2008 **වර්ෂයේ** සිටම අධිකාරිය එම ආදායම, ඒකාබද්ධ අරමුදලට බැර නොකොට, අධිකාරියේ ආදායම් ලෙස සලකා කටයුතු කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානයට යොමුවිය.

**2018 සිට 2023 නොවැම්බර් දක්වා** කාලය තුළ රැස් කර තිබූ **රු. මිලියන 20,630 ක** මුදල භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොමැති අතර එම OSS ආදායම, අධිකාරියේ සමස්ථ ආදායමෙන් **80%ක** ප්‍රමාණයක් වන ප්‍රධානතම ආදායම් මූලාශ්‍රය ලෙස අධිකාරිය සලකා තිබුණි.

නමුත් අධිකාරියට මූල්‍යමය දුෂ්කරතාවයක් නොතිබුණු බැවින්, ගැසට් නිවේදනයේ නියෝග උල්ලංඝණය කරමින් මෙම මුදල රඳවා ගැනීම දැඩි වරදකි.

කෙසේ වෙතත්, **2023 නොවැම්බර් 28** දිනැති අංක **23/1937/628/094** දරණ කැබිනට් තීරණය ප්‍රකාරව, එකතු වන OSS ආදායමෙන් **මාසිකව රුපියල් මිලියන 90 ක** මුදලක් අධිකාරියේ මෙහෙයුම් වියදම් සඳහා වෙන් කරගෙන, ඉතිරි මුදල භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර තිබිණි. මෙලෙස රඳවා ගත් ආදායමෙන් යම් ප්‍රමාණයක් විවිධ ප්‍රාග්ධන වියදම් සඳහා යොදවාගෙන තිබුණු අතර රුපියල් **බිලියන 4ක** මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) නිර්ණායක අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAA) මූල්‍ය ස්වාධීනත්වයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය බවත් ඒ සඳහා විදේශීය විකුණුම් අධිභාර (OSS) ආදායම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවත් අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. අන්තර්ජාතික සිවිල් ගුවන් සංවිධානයේ (ICAO) නිර්ණායකවලට අනුව අධිකාරිය ස්වයං මූල්‍යනය වන ආයතනයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයක් ආයතනය වෙත රඳවා ගෙන ඉතිරි විදේශීය විකුණුම් අධිභාර (OSS) ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා ගත යුතු නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳව පුළුල්ව අධ්‍යයනයක් සිදු කොට ඒ පිළිබඳ ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කිරීම.**

**II. අධිකාරියේ ස්වයං මූල්‍යනය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයක් ආයතනය වෙත රඳවා ගැනීම පිණිස 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ 07 සහ 08 වගන්ති වලට අදාළ නියෝගය වෙනස් කර ගැනීම පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට තීරණයක් ලබා ගැනීම.**

**III. ආයතනය සතු සමස්ථ වත්කම් හා බැරකම් සම්බන්ධ ප්‍රකාශනයක් පිළියෙල කිරීම.**

**IV. 2023 නොවැම්බර් 28 දිනැති අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය නැවත සලකා බලා අධිකාරියේ ස්වයං මූල්‍යනය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය පිළිබඳව තීරණයක් ගැනීම.**

**06. <u>අධිකාරිය වෙත ගුවන් සමාගම් වෙතින් අය විය යුතු අපගමන බදු මුදල්වල හිඟ පැවතීම</u>**

**2003** අංක **25** දරණ මූල්‍ය පනතේ **3** සහ **4** වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන ගුවන් මගීන්ට ශ්‍රී ලංකාවෙන් පිටතදී නිකුත් කරනු ලබන සෑම ගුවන් ටිකට්පතකින්ම හෝ ශ්‍රී ලංකාවෙන් පිටත්වන පුද්ගලයන්ට ශ්‍රී ලංකාවෙන් නිකුත් කරනු ලබන සෑම ගුවන් ටිකට්පතකින්ම ඇමරිකන් ඩොලර් **60**කට සමාන අපගමන බද්දක් අය කර අදාළ ගුවන් සමාගම් විසින් අධිකාරියට ගෙවිය යුතුය. **2025 ජූනි 30** වන විට එම අපගමන බද්දෙන් රු. මිලියන **30,844.4 ක්** සහ ඇ.ඩො. **1,541,962 ක්** ලෙස අධිකාරියට ගුවන් සමාගම්වලින් අය විය යුතු මුදල්වල හිඟයක් පැවතිණි.

ඒ අනුව පහත සඳහන් ගුවන් සමාගම්වලින් පමණක් අයවිය යුතු හිඟ මුදල් විස්තර පහත පරිදි වේ (2025.06.30 දිනට):

| ගුවන් සමාගමේ නම | බද්ද - රු.මිලියන | පොළිය- රු.මිලියන | මුළු මුදල- රු.මිලියන |
|---|---|---|---|
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | 22,450.9 | 4,669 | 27,120.3 |
| ෆිට්ස් එයාර් සමාගම | 2,074.7 | 445.6 | 2,520.3 |

ඉහත පරිදි බදු ගෙවීම පැහැර හරින ගුවන් සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය **ප්‍රතිපාදන 2003 අංක 25 දරණ මූල්‍ය පනතේ නොමැති** හෙයින් පනත සංශෝධනය කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා සිදු කරමින් පවතින බව අනාවරණය විය.

2022 වසරේ සිට කොවිඩ් වසංගතය හේතුවෙන් ඇති වූ මූල්‍ය දුෂ්කරතා නිසා අපගමන බදු ආදායම සිය මූල්‍ය කටයුතු සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම භාවිතා කර ඇති බවත්, එසේ බදු මුදල් රඳවා ගැනීමට 2003 අංක 25 දරන මූල්‍ය පනත අනුව සමාගමට කිසිදු ප්‍රතිපාදනයක් නොමැති බව අධිකාරිය විසින් කිහිපවරක්ම දැනුම් දී ඇති බවත්, 2024 වර්ෂයේ සිට සිවිල් ගුවන් සේවා අධිකාරියට අපගමන බදු ගෙවීම ශ්‍රී ලංකන් ගුවන් සමාගම නැවත ආරම්භ කර ඇති බවත්, මෙම අවස්ථාව වන විට ගෙවීමට ඇති හිඟ මුදල 2022-2024 කාලයට අදාළ හිඟ බදු මුදල සහ ඊට අදාළ පොළිය බවත් අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**අපගමන බද්ද, නියාමන සේවාවලින් ලැබෙන ආදායම, පොළී ආදායම සහ වෙනත් මෙහෙයුම් නොවන ආදායම් ඇතුළු සිවිල් ගුවන්සේවා අධිකාරියට**

**ලැබෙන අනෙකුත් ආදායම් පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කොට ඒ පිළිබඳ ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කිරීම.**

**07. <u>අධිකාරිය සතුව තිබූ තලංගම, අකුරේගොඩ ඉඩම වෙනුවට සීතාඑළිය කඳපොළ වනාන්තරයෙන් ලබා දුන් ඉඩමේ අයිතිය පවරා ගැනීමට අධිකාරිය අපොහොසත් වීම.</u>**

එවකට සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව සතුව තිබූ, අධි සංඛ්‍යාත සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය ඉදි කර තිබූ **තලංගම, අකුරේගොඩ අක්කර 52**ක ඉඩම, **2006 ජුනි 13** දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දී ඇති තීරණය අනුව ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම සඳහා පවරාගෙන තිබුණි. එම ඉඩම වෙනුවට සුදුසු ඉඩමක් හා සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට **රු. මිලියන 161**ක් භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීමට අනුමැතිය ලැබී ඇත.

කෙසේ වෙතත්, **2002 අංක 34 දරන ගුවන් සේවා අධිකාරි පනතේ 9** වැනි **වගන්තිය** අනුව තලංගම ඉඩම ගැසට් නිවේදනයක් මඟින් අධිකාරියට පවරා දීමට එවකට සිටි අමාත්‍යවරයා කටයුතු කර නොමැති බැවින්, එම ඉඩමේ හිමිකම අධිකාරිය සතුව නොතිබූ බවත්, ඉඩම ලබා දීම සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා **රු. මිලියන 161**ක් ලබා දීම සිදු කොට ඇත්තේ සීමාසහිත ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම (AASL) වෙත බවත් අනාවරණය විය.

තලංගම ඉඩම වෙනුවට ලබා දුන් **සීතාඑළිය කඳපොළ වනාන්තරයේ හෙක්ටාර 0.9431** ක භූමි ප්‍රමාණය ද, **2025 පෙබරවාරි 28 දින වන විටත්** අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණු බවත්, සීතාඑළිය ඉඩමේ භුක්තිය (possession) ගැසට් නිවේදනයක් මඟින් AASL සමාගමට පවරා ඇති බවත්, ඉඩමේ අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට මේ වන විට පියවර ගනිමින් පවතින බවත්, නිරීක්ෂණය විය.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ දැනුවත් බවකින් තොරව දේශපාලන අධිකාරිය විසින් ඉඩම් පවරා ගැනීම තුළින් අධිකාරියේ නියාමන කාර්යභාරයේ අඩුවක් නිරීක්ෂණය වන බව කාරක සභාව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**සිවිල් ගුවන් සේවා අධිකාරිය සතු දේපළ සහ වත්කම් සම්බන්ධයෙන් සම්පූර්ණ විගණනයක් සිදු කොට එම දත්ත යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.**

## 08. <u>වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය.</u>

**2022 මැයි 18** වන දින වීරවිල සංචාරක බංගලාවේ කොටසක් ගින්නකින් හානි වී තිබූ අතර, කළමනාකරණ හා නඩත්තු සේවා සපයන සමාගමේ සේවකයෙකුගේ නොසැලකිල්ල ඊට හේතුවී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අධිකාරිය විසින් මුදල් රෙගුලාසි **101, 103 සහ 104** ප්‍රකාරව නිසි පියවර ගෙන නොතිබුණු බවත් අනාවරණය විය.

මෙම ගින්නෙන් පසු, රු. **252,000**ක කාර්යසාධන බැඳුම්කරයෙන් රු. **226,000**ක මුදලක් අය කර ගෙන හානිය පියවා අලුත්වැඩියා කටයුතු නිම කර ඇති බවත්, කළමනාකරණ සහ නඩත්තු සේවා ආයතනයට අධිකාරිය මාසිකව රු. **210,000/-ක්** ගෙවා ඇති නමුත්, බංගලාවෙන් ලැබූ වාර්ෂික ආදායම රු. **200,000/- – 400,000/-** අතර මුදලක් බවත්, බංගලාවේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකළ බව හෙළිවීම හේතුවෙන් අදාළ ආයතනය මේ වන විට අසාදු ලේඛනගත කර බවත් නිරීක්ෂණය විය.

ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රතිසංස්කරණ සඳහා වෙන් කොට තිබුණේ රු. මිලියන 4.5ක් වුවද බංගලාවේ ප්‍රතිසංස්කරණ සඳහා අධිකාරිය

ඇස්තමේන්තු ගත කළ **රු. මිලියන 16** ඉක්මවා මුළු වියදම **රු. මිලියන 24ක්** වැය කොට තිබුණි.

ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ **රු. මිලියන 4.5ක්** වෙන් කොට තිබුණු නමුත් බංගලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අධිකාරිය මුලින් ඇස්තමේන්තු ගත කළ **රු. මිලියන 16** ඉක්මවා මුළු වියදම වශයෙන් **රු. මිලියන 24ක්** වැය කර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රතිසංස්කරණ සඳහා **රු. මිලියන 4.5ක්** වෙන් කොට තිබුණු බංගලාවේ තාප්පය සඳහා පමණක් බවත්**,** මුළු බංගලාවම ප්‍රතිසංස්කරණය කිරීමට කළමනාකාරිත්වය තීරණය කළ බැවින් මූලික ඇස්තමේන්තුව **රු. මිලියන 25ක්** වූ බවට කරුණු ඉදිරිපත් විය.

තවද, 2016 වසරේ සිට වසර 2 න් 2ට සේවා සතුටුදායක නම් ඊළඟ වසරේ දී අලුත් වන ආකාරයේ ගිවිසුම් කළමනාකරණ සහ නඩත්තු සේවා ආයතනය සමඟ අත්සන් කර තිබූ බවත්, 2019 වසරේ සිට වසර එක හමාරක කාලයකට පමණක්, එවකට පැවති තත්ත්වය මත, අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක සේවා සපයන ආයතනයට ගිවිසුමකින් තොරව එම මිල ගණන්වලටම සංචාරක බංගලාවේ සේවා සැපයීම සඳහා ලබා දී තිබූ බවත්, ඒ සඳහා රුපියල් මිලියන 6ක් ගෙවා තිබුණු බවත්, සංචාරක බංගලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ කාලය තුළද මුල් සේවා සපයන්නා විසින් යම් යම් සේවා සැපයූ බැවින්, එම කාලසීමාව සඳහා රුපියල් මිලියනක ගෙවීමක් සිදු කර ඇති බවත් අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීමේ සමස්ථ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදු කොට වාර්තාවක් ඉදිරිපත් කිරීම. එමෙන්ම කළමනාකරණ සහ නඩත්තු සේවා සැපයූ ආයතනය පිළිබඳ තොරතුරු, එම ආයතනය තෝරා ගෙන තිබූ ආකාරය, එම ආයතනයට**

**මුදල් ගෙවූ ආකාරය සහ එම ගෙවූ මුදලට සාපේක්ෂව සේවාවන් සිදු වී තිබුණිද යන කරුණු එම වාර්තාවට ඇතුළත් කිරීම.**

**II. විගණනයට අදාළ සියලු තොරතුරු විගණනය සිදු කරනු ලබන අවස්ථාවේදීම ජාතික විගණන කාර්යාලයට ලබා දීමට සෑම විටදීම කටයුතු කිරීම.**

**09. <u>අධිකාරිය විසින් අධ්‍යක්ෂ ජනරාල්ට ලබා දෙන නිල නිවාසය අලුත්වැඩියා කිරීම.</u>**

අධිකාරිය විසින් 2021 දී අංක 09 දරණ නිල නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර තිබූ අතර ඒ සඳහා රු. මිලියන 10.67ක මුදලක් වැය කර තිබුණද ප්‍රතිසංස්කරණයට පෙර තිබූ ප්‍රධාන අඩුපාඩු ප්‍රතිසංස්කරණයෙන් පසුවත් එසේම පැවතිණි.

මුල් වරට පුවත්පත් දැන්වීම් මඟින් ලංසු කැඳවූ විට ලංසු කිසිවක් ලැබී නොමැති බවත්, නැවත ලංසු කැඳවූ විට රුපියල් මිලියන 36ක මුදලකට ලංසු ලැබී ඇති නමුත්, එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, මෙම අවස්ථා දෙක අසාර්ථක ලංසු කැඳවීම් බවත්, මුළු වියදම වූ රු. මිලියන 10.67 න් ප්‍රතිසංස්කරණය සඳහා වැය වී ඇත්තේ රු. මිලියන 7ක ප්‍රමාණයක් පමණක් බවත්, ඉතිරි මුදල ගෘහ භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම් සඳහා වැය කර ඇති බවත් අනාවරණය විය.
ගෙවූ මුදලට සාපේක්ෂව සිදු කොට ඇති ප්‍රතිසංස්කරණය ප්‍රමාණවත් නොවන බවටද කරුණු අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**මාසයක් ඇතුළත නිල නිවාසය ප්‍රතිසංස්කරණය කිරීමේ සමස්ථ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදු කොට වාර්තාවක්**

**ඉදිරිපත් කිරීම. ප්‍රතිසංස්කරණය සිදු කළ ආයතනයට මුදල් ගෙවූ ආකාරය සම්බන්ධ කරුණු, එම ගෙවූ මුදලට සාපේක්ෂව ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සිදු වී තිබුණිද යන කරුණු එම වාර්තාවට ඇතුළත් කිරීම.**

**10. <u>විධිමත් බදු ගිවිසුමකින් තොරව සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්) සමාගමට ඉඩම් ලබාදීම.</u>**

2002 අංක 34 දරණ සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ තුන්වැනි උපලේඛනයේ විස්තර කර ඇති ගුවන් යානා පහසුකම් සහ ඉඩම්, විධිමත් බදු ගිවිසුමකින් හෝ කුලී ගිවිසුමකින් තොරව සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්) සමාගමට (AASL) ලබා දී තිබුණි.

2002 අංක 34 දරණ පනතේ විධිවිධාන ප්‍රකාරව, පනතේ දෙවැනි සහ තුන්වැනි උපලේඛනවල සඳහන් අධිකාරියට පැවරී ඇති ගගන යත්‍රාංගන, ගුවන් යානා පහසුකම් සහ ආබද්ධ ඉඩම්වල භුක්තිය සිවිල් ගුවන් සේවා මෙහෙයුම්කරු වන AASL වෙත ලබා දිය හැකි බව දක්වා ඇති නමුත් මෙම පැවරීම විධිමත් ලෙස සිදු කර නොතිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී

මෙම පහසුකම් සහ ඉඩම්වල භුක්තිය පිළිබඳව AASL සමාගමෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ දිගින් දිගටම සාකච්ඡා පැවැත්වූ බවත්, ගාස්තු පැණවීමේ යෝජනා අංක 2422/38 සහ අංක 2422/39 යටතේ 2025.02.06 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද බවත්, එම යෝජනා පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇති බවත්, අනුමැතිය ලැබීමෙන් පසු ගාස්තු ලැබීමේ ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරන බවත් කළමනාකාරීත්වය පැවසීය.

## 11. <u>**යාපනය ගුවන් තොටුපලේ ඉඩම් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම.**</u>

**2019 ඔක්තෝබර් 17** වැනි දින යාපනය ගුවන් තොටුපළ, ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස මෙහෙයුම් ආරම්භ කර ඇත. ඒ සඳහා **2019 සැප්තැම්බර් 26** දිනැති අංක **2142/74** දරණ ගැසට් පත්‍රය මඟින් සහ කැබිනට් තීරණය අංක **CP/19/2008/105/009-1** මඟින් අනුමැතිය ලබා දී තිබුණද, අධිකාරිය විසින් යාපනය ගුවන් තොටුපළේ **අක්කර 349**ක ඉඩම්වල මායිම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර, ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබීම කාරක සභාවේ අවධානයට යොමු විය.

අදාළ ඉඩම් මායිම් ගැසට් කිරීම සඳහා අවශ්‍ය නියෝග නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සමඟ ලැබුණු ලේඛනය අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා අමාත්‍යාංශයට යවා තිබුණි.

## 12. <u>**කේප්ටවුන් සම්මුතිය බලාත්මක කිරීම.**</u>

කේප්ටවුන් සම්මුතිය (Cape Town Convention) බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්මුති පනත් කෙටුම්පත, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කර ඇති අතර, එය 2025 මැයි 15 වැනි දින නිෂ්කාශනය සඳහා නීතිපතිවරයා වෙත යොමු කර තිබුණි.

නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කොට ඇති සංශෝධිත පනත් කෙටුම්පත සඳහා නීතිපතිවරයාගේ නිෂ්කාශනය ලැබීමට නියමිත බව, එහි වර්තමාන තත්ත්වය පිළිබඳව විමසීමේදී අනාවරණය විය.